(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 16.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2025 පෙබරවාරි 05 බදාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

150/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත අහෝසි කිරීමට පියවර ගන්නේද;

(ii) නොඑසේ නම්, එම පනතට සංශෝධන ගෙන ඒමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, එම සංශෝධන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

177/2024

ගරු රවී කරුණානායක මහතා,— මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහජන බැංකුව සංස්ථාගත කළ දිනය;

(ii) වත්මන් සභාපතිවරයාගේ, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ නම්;

(iii) ශාඛා සහ සේවක සංඛ්‍යාව;

(iv) අද වන විට කොටස් නිකුතු ප්‍රාග්ධනය;

(v) එය ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය පිළිබඳ බාසල් (BASEL) නියමයට අනුකූල වන්නේද;

(vi) අනුකූල නොවන්නේ නම්, ඒවා විසඳීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වසර 10 සඳහා ලාභය සහ ඉදිරි වසර 3 සඳහා අපේක්ෂිත ලාභය;

(ii) ඉහත (i) අනුව පසුගිය වසර 10 සඳහා ආයෝජනය මත ප්‍රතිලාභ;

(iii) පසුගිය වසර 5 සඳහා පරිපාලන පිරිවැය සහ ආන්තික ණය අනුපාතිකය;

(iv) පරිපාලන පිරිවැය ණය අනුපාතිකයේ ප්‍රතිශතයක් ලෙස;

(v) 2019 සිට මේ දක්වා ශේෂ පත්‍ර අගයන්;

කවරේද යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රුපියල් බිලියනයකට වඩා වැඩි ණය මුදල් කපා හැර තිබේද;

(ii) ඊට අදාළ ආයතනවල නම්;

(iii) ණය කපා හැරීම් සඳහා අනුගමනය කර ඇති නෛතික කාර්යපටිපාටි කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

243/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා නාගරික සංවර්ධන අධිකාරිය විසින් කොළඹ දිස්ත්‍රික්කයේ ඉදිකර ඇති මහල් නිවාස ඒකක සංඛ්‍යාව එක් එක් මහල් නිවාස සංකීර්ණය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම නිවාස ඒකක අතරින් මේ දක්වා ඔප්පු ලබා දී ඇති නිවාස ඒකක සංඛ්‍යාව කොපමණද;

(iii) ඔප්පු ලබා නොදුන් නිවාස ඒකක සඳහා ඔප්පු ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

249/2024

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොවිඩ්-19 වසංගතය නිසා මිය ගිය අයගේ ආදාහනය සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිමය තීරණය, "විශේෂඥ කමිටුවක්" විසින් නොමඟ යවනු ලැබූ බවට දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යවරයා විසින් 2022.11.29 වන දින කරන ලද ප්‍රකාශය සමඟ එතුමා එකඟ වන්නේද;

(ii) ඉහත සඳහන් කරන ලද කමිටුව රජය විසින් පත් කරන ලද කමිටුවක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත සඳහන් කරන ලද කමිටුව රජය විසින් පත් කරන ලද කමිටුවක් නම්—

(i) විශේෂයෙන්ම කොවිඩ්-19 වසංගතය හේතුවෙන් මිය ගිය අයගේ මෘත දේහ බැහැර කිරීම සම්බන්ධයෙන් එහි නිර්දේශ කවරේද;

(ii) පත් කිරීමේ බලධාරියා කවරෙක්ද;

(iii) විෂය පථය සහ/හෝ බලතල කවරේද;

(iv) සාමාජිකයින්ගේ නම් සහ තනතුරු කවරේද;

(v) සභාපතිගේ නම කුමක්ද;

(vi) එය අඛණ්ඩව රැස්වන්නේද;

(vii) එසේ අඛණ්ඩව රැස් නොවේ නම්, අවසන් වරට රැස්වූ දිනය කවරේද;

(viii) මේ දක්වා පවත්වා ඇති රැස්වීම් සංඛ්‍යාව කීයද;

(ix) රැස්වීම් පැවැත්වූ ස්ථානය කවරක්ද;

(x) එක් එක් රැස්වීමෙහි සභාපතිත්වය දැරූ අයගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

255/2024

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, නුගදූව, "වලහන්දූව වත්ත" ඉඩම කැබලි කර විවිධ ව්‍යාපෘති සඳහා ලබා දීමට සැලසුම් කර තිබූ බව දන්නේද;

(ii) එම ව්‍යාපෘතිවල වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එම ව්‍යාපෘති සඳහා මේ දක්වා වැය කර ඇති මුදල කොපමණද;

(iv) එක් එක් ව්‍යාපෘතියේ අවශ්‍යතාවය හා අපේක්ෂිත ප්‍රතිලාභ හඳුනාගෙන තිබේද;

(v) ඒ අනුව, අත්‍යවශ්‍ය ව්‍යාපෘති කවරේද;

(vi) ඒ අතරින් ඇතැම් ව්‍යාපෘති මේ වනවිට අතරමග නතර වී තිබේ නම්, එම ව්‍යාපෘති නැවත ආරම්භ කිරීමේ හැකියාවක් තිබේද;

(vii) නොඑසේ නම්, එම ව්‍යාපෘති වෙනුවෙන් දැරීමට සිදුවන අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 3.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— විදේශ විනිමය පනත යටතේ නියමය,— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 දෙසැම්බර් 19 දිනැති අංක 2415/56 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.01.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 1),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 දෙසැම්බර් 18 දිනැති අංක 2415/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.01.21 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි (අංක 2),— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 දෙසැම්බර් 24 දිනැති අංක 2416/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.01.21 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා,— බුද්ධිමය දේපළ පනත යටතේ නියෝග,— 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 160අ, 161ආ, 161ඇ, 161ඈ, 161ඉ, 161ඊ, 161උ, 161එ, 161ඔ සහ 161ඕ වගන්ති සමඟ කියවිය යුතු 204 වගන්තිය යටතේ එවකට වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා, සමුපකාර සංවර්ධන, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ඔක්තෝබර් 22 දිනැති අංක 2407/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.01.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

විසර්ජන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

289/2024

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "කොවිඩ්-19" රෝගයෙන් මරණයට පත් වූ පුද්ගලයන්ගේ මළ සිරුරු ආදාහනය කිරීමට එරෙහිව දේශීය හා ජාත්‍යන්තර වශයෙන් විරෝධතා මතුවීම හේතුවෙන්, මඩකලපුව, "මජ්මා නගර්" ප්‍රදේශයේ ඉඩමක එම මළ සිරුරු භූමදානය කරන ලද බව දන්නේද;

(ii) මරණයට පත්ව එලෙස භූමදානය කරනු ලැබූ එක් එක් පුද්ගලයාගේ නම, ලිපිනය, ආගම, ස්ත්‍රී/පුරුෂ සමාජභාවය, මළ සිරුර ලියාපදිංචි කළ අංකය, භූමදානය කරන ලද දිනය, මරණයට පත් වූ එක් එක් පුද්ගලයා වෙනුවෙන් භූමදානය කරන ලද අවස්ථාවට සහභාගීවීමට අවසර ලත් පුද්ගලයන් සංඛ්‍යාව, එම සහභාගී වූ පුද්ගලයන්ගේ නම් සහ ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මරණයට පත් වූ එක් එක් පුද්ගලයාගේ භූමදානය වෙනුවෙන් සහභාගී වූ පුද්ගලයන්ගෙන් මුදල් අය කරනු ලැබුවේද;

(iv) එසේ නම්, අය කරන ලද මුදල කොපමණද;

(v) මුදල් අය කිරීම සඳහා බලය ලත් ආයතන/පුද්ගලයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද ?